**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව - 2022**
**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ගොඩනැගිලි සංවර්ධනය කිරීම වෙනුවෙන් දරා තිබුණු රු.673,160 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.20,020,739 ක ප්‍රාග්ධන ණයහිමි සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දී කඩ කාමර 08 ක් සඳහා බිල් කරන ලද රු.25,390,600 ක එක්වන් මුදල් ගිණුම් ගතකර නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ දී පුස්තකාල පොත් මිලදී ගැනීම වෙනුවෙන් ලබා දී තිබුණු රු.310,748 ක වට්ටම ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.128,173 ක් වටිනා පුස්තකාල පොත්, වර්ෂයේ ආදායමට සහ ප්‍රාග්ධන වැය යටතේ ගිණුම් ගතකර නොතිබුණි. | - එම - | - එම - |
| (ඊ) | සභාවට අයත් වටිනාකම රු.100,000 ක් වූ ප්‍රයිම් ලැන්ඩ් ඉඩම සහ පර්චස් 40 ක් වූ තල්ගහවත්ත ඉඩමේ වටිනාකම හඳුනාගෙන ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු.19,001,530 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | අදාළ ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.14,476,768 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | පැරණි ලේඛන පරීක්ෂා කර ලේඛනගත කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. | සමීක්ෂණය කර ඉදිරිපත් කරන බව. | රීති අනුව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.1,528,655 ක් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.56,352,864 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,074,312 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස් කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,578,798 | 2,955,934 | 3,219,079 | 5,987,497 | 3,208,798 | 2,968,781 | 14,939,107 | 6,250,642 |
| කුලී | 7,893,230 | 6,481,989 | 22,230,310 | 18,373,621 | 7,693,230 | 10,846,495 | 77,215,527 | 34,121,942 |
| බලපත්‍ර ගාස්තු | 400,100 | 172,935 | 172,935 | 125,350 | 355,100 | 170,258 | 418,958 | 125,350 |
| වෙනත් ආදායම් | 8,376,600 | 7,868,597 | 7,868,597 | 45,192 | 6,496,100 | 423,383 | 513,767 | 45,192 |
| | 20,248,728 | 17,479,455 | 33,490,921 | 24,531,660 | 17,753,228 | 14,408,917 | 93,087,359 | 40,543,126 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට අයවිය යුතු වූ මුළු හිඟ ආදායම රු.40,543,126 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එය රු.24,531,660 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට සැලසුම් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. |
| (ආ) | සභාවේ වරිපනම් තක්සේරුව වසර 14 කින් සිදු කර නොතිබුණි. | වරිපනම් තක්සේරුව 2023 වසරේ සිදුකරන බව. | වරිපනම් බදු යාවත්කාලීන කර අයකරගත යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට අය විය යුතු බදු කුලී ආදායම රු.34,121,942 ක් වූ අතර, වර්ෂ අවසානයට එය රු.18,373,621 ක් විය. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට කඩ කාමර 43 කින් අයවිය යුතු හිඟ එක්වන් මුදල් රු.36,230,400 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. සභාව සතු කඩ කාමර 05 ක් සම්බන්ධයෙන් ගිවිසුම් ගත වී නොතිබූ අතර, කඩ කාමර 56 ක ගිවිසුම් කල් ඉකුත් වී තිබුණි. | හිඟ අයකර ගැනීමට හා ගිවිසුම්ගත වීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගිවිසුම් යාවත්කාලීන කළ යුතු වේ. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.708,033 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.74,150 ක් ලැබිය යුතුව තිබුණි. | මුදල් ගෙවන ලෙස දැනුම් දී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ගිනි ගැනීමකට ලක් වී තිබූ අතර, එය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.1,973,715 ක් සභාව විසින් දරා තිබුණු අතර, 2022 වර්ෂය අවසන් වන විටත් වගකිව යුතු පාර්ශවය හඳුනාගෙන නොතිබුණි. | සභා තීරණයක් අනුව අලුත්වැඩියා කළ බව. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 08 ක වර්තමාන වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී තක්සේරු කිරීමට කටයුතු කරමින් සිටින බව. | වත්කම් තක්සේරු කර ලේඛනගත කළ යුතු වේ. |
| (ආ) | කුරුදුගහ හැතැක්ම පිහිටි භූමිය තුළ සභාව සතු කඩ කාමර 14 ක් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකර දීර්ඝකාලීනව වසා දමා තිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නැත. | සභා දේපලවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී කර්මාන්ත 04 කට අදාළව පැති බැමි හා කාණු ඉදිකිරීමේ දී අවශ්‍ය කරන පස් කැපීම සඳහා ස්කැවේටර් යන්ත්‍රය භාවිතා කර තිබුණ ද, ඒ සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මිනිස් ශ්‍රමයෙන් පස් කැපීම සඳහා වූ මිල අනුපාතය යොදා ගැනීම නිසා වර්ග මීටර් 175 ක් සඳහා රු.93,123 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | යන්ත්‍ර මගින් පස් කැපීම සිදුකළ බව. | වැඩිපුර ගෙවීම් අයකළ යුතු වේ. |
| (ආ) | කර්මාන්ත 2 කට අදාලව ප්ලම් කොන්ක්‍රීට් මගින් පැති බැමි ඉදිකිරීමේ දී ඒ සඳහා පදම් කළ ලෑලි (Plywood) පුවරු භාවිතා කර හැඩයම් වැඩ (Form Work) සිදුකර තිබුණ ද, නියමිත මිල අනුපාතය යොදා නොගැනීම නිසා වර්ග මීටර් 175 ක් සඳහා රු.723,782 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය Plywood Sheet භාවිතා කර හැඩයම් යෙදීම සඳහා ඇති එකම මිල අනුපාතය ST-63 බව. | වැඩිපුර ගෙවීම් අය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කර්මාන්ත 03 කට අදාළව කොන්ක්‍රීට් වැඩ සඳහා රු.18,577 ක් ද, ගල් ගොනු කිරීම සඳහා රු.34,521 ක් ද සහ රොන් මඩ ඉවත් කිරීම සඳහා රු.46,250 ක් ද වශයෙන් එකතුව රු.99,348 ක් වැඩිපුර ගෙවා තිබුණි. | සම්මත හා විධිමත් පරිදි කළ බව. | - එම - |
| (ඈ) | ටී.ඩී. සමරවීර ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ කර්මාන්තය පස් මුට්ට කිරීමේ අවශ්‍යතාවයක් නොමැතිව ඒ සඳහා රු.344,894 ක් ද, කොන්ක්‍රීට් වැඩ සඳහා නියමිත මිල අනුපාතය භාවිතා නොකිරීම නිසා රු.44,432 ක් ද වශයෙන් රු.389,326 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | පස් ප්‍රමාණය මිණුම් කිරීමේ සම්මත ක්‍රමය වන්නේ පස් මුට්ට කර මිණුම් ලබා ගැනීම බව. | - එම - |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ ඉටු කිරීමට නියමිතව තිබූ රු.12,947,380 ක් වටිනා කර්මාන්ත 03 ක වැඩ ආරම්භ කර නිම කිරීමට කටයුතු කර නොතිබුණි. | කර්මාන්ත දෙකක වැඩ ආරම්භ කර ඇති බව. | සැලසුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.334,730 ක් වටිනා ණය ශේෂ 29 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් සිටින බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |